# ලංකාණ්ඩුවේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 12,762 — 1961 නොවැම්බර් 11 වැනි සෙනසුරාද — 11.11.1961

(ආණ්ඩුවේ බලය පිට ප්‍රසිද්ධ කරන ලදි)


## I වැනි කොටස : (I) වැනි ජෙදය — සාමාන්‍ය

### ආණ්ඩුවේ නිවේදන

**1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝග**

**18 (1) වෙනි නියෝගය යටතේ වූ ආඥාව**

මෙහි උපලේඛනයෙහි විස්තර කෙරෙන එක් එක් සංවිධානය සම්බන්ධයෙන් ඒ සංවිධානය විසින් හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් විසින් මහජන ආරක්ෂාවට, මහජන සාමය පවත්වා ගැනීමට හෝ අත්‍යවශ්‍ය සේවාවන් පවත්වා ගැනීමට හානි කරවූ කාර්යයන් සඳහා නොහොත් *1961 අංක 8 දරන හදිසි (විවිධ විධිවිධාන හා බලතල) නියෝගවල 16 වෙනි නියෝගයේ* (අ) සිට (ඌ) දක්වා වූ ජෙදවල හෝ 12 වෙනි නියෝගයේ (1) වෙනි ජෙදයේ (ආ) සහ (ඇ) යනු අනුච්ජෙදයන්හි සඳහන් කාර්‍ය කිසිවක් සඳහා ක්‍රියා කිරීමේ නොහොත් ඒ සංවිධානය හෝ එහි සාමාජිකයන් හෝ පාක්ෂිකයන් ප්‍රයෝජනයට ගැනීමේ අන්තරාය ඇතැයි සෑහීමට පත්වූයෙන්, අග්‍රාමාත්‍ය සිරිමාවෝ රත්වත්තේ ඩයස් බණ්ඩාරනායක වන මම, ඒ සංවිධානය තහනම් කරනු ලැබූ සංවිධානයක් ලෙස ඒ නියෝගවල 18 වෙනි නියෝගයේ (1) වෙනි ජෙදයෙන් මා වෙත පැවරී ඇති බලතලවල ප්‍රකාර මේ ආඥාවෙන් ප්‍රකාශ කරමි.

සිරිමා ආර්. ඩී. බණ්ඩාරනායක,
අග්‍රාමාත්‍ය.

*1961 නොවැම්බර් 11,*
කොළඹ.

### උපලේඛනය

සාමාන්‍යයෙන් ලංකා ෆෙඩරල් පක්ෂය යනුවෙන් හැඳින්වෙන පක්ෂය.


ලංකාණ්ඩුවේ මුද්‍රණාලයේ මුද්‍රණය කරන ලදී.

2039—ජෙ. ඇන්. ආර් 20217—6,400 (61/11)